Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

## බිංගිරිය ප්‍රාදේශීය සභාව

### ශිල්පීය හා ශිල්පීය නොවන III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

බිංගිරිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී පවතින පහත සඳහන් ප්‍රාථමික ශ්‍රේණියේ තනතුරුවලට සුදුස්සන් තෝරා ගැනීම සඳහා සුදුසුකම් ඇති බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමාණය* | *බඳවාගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද* |
|---|---|---|---|---|
| ප්‍රාථමික ශිල්පීය නොවන | | | | |
| 1 | සෞඛ්‍ය කම්කරු | 03 | රා.ප.ච. 3/2016 පී.එල්. 1-2016 රු. 24,250 | 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම |
| 2. | කාර්යාල කාර්ය සහායක | 01 | රා.ප.ච. 3/2016 පී. එල්. 1-2016 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410 | 1. අධ්‍යයනය පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකක් (02) වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) |
| 3. | පුස්තකාල උපස්ථායක | 03 | | |
| 4. | ජලනල පොම්ප ක්‍රියාකරු | 01 | | |
| 5. | වැඩ ක්ෂේත්‍ර කම්කරු | 04 | | |
| 6. | විදුලි කාර්මික | 01 | රා.ප.ච. 3/2016 පී. එල්. 2-2016 රු. 25,250 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,450 | 1. රජයේ පිළිගත් කාර්මික විද්‍යාලයක හෝ වෘත්තීය පුහුණු ආයතනයක හෝ තෘතීය ආයතනය විසින් පිළිගත් ආයතනයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ පුහුණු සහතිකය<br>2. දෙපාර්තමේන්තු සේවකයින් සඳහා කුඩා කර්මාන්ත දෙපාර්තමේන්තුවේ අවසාන සහතික පත්‍ර විභාගය හෝ කාර්මික විද්‍යාලයක විදුලි කාර්මික ශිල්පය පිළිබඳ අවසාන පුහුණු සහතිකය.<br>*පළපුරුද්ද :*<br>පිළිගත් ආයතනයක වසර 02 ක පළපුරුද්ද (සහතිකයක් මගින් සනාථ කළ යුතුය.) |
| ප්‍රාථමික ශිල්පීය | | | | |
| 7. | බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු | 01 | රා.ප.ච. 3/2016 පී. එල්. 2-2016 රු. 25,790 - 10x270 - 10x300 - 10x330 - 12x350 - රු. 38,990 | *බාහිර අයදුම්කරුවන් සඳහා :*<br>1. අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත් වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර) අවම වශයෙන් එක් වතාවක දී විෂයයන් 05ක් සමත් විය යුතුය. |
| 8. | රියදුරු | 03 | | |

| අනු. අංකය | තනතුරු නාමය | පුරප්පාඩු සංඛ්‍යාව | වැටුප් පරිමාණය | බඳවාගැනීමට අවශ්‍ය අවම අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද |
|---|---|---|---|---|
| | | | | *අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :*<br><br>2. අදාළ ආයතනයේ ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 08 ශ්‍රේණිය (9 වසර) සමත් විය යුතුය.<br><br>වෙනත් සුදුසුකම් :<br><br>1. A පන්තියේ රියදුරු බලපත්‍රයක් තිබිය යුතුය.<br>2. වාහන රියදුරෙකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් තිබිය යුතුය. (සේවා සහතික මගින් සනාථ කළ යුතුය.) |

02. *බඳවා ගැනීමේ ක්‍රමය :*

අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කොට, සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව බඳවා ගැනීම කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනය ඉදිරියේ දී දැනුම් දෙනු ලැබේ.

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

3.1 මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. (විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට යටත් ව පත්වීම ලබාදේ.)

3.2 තෝරාගනු ලබන්නේ අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත්ව ය. එම කාලය තුළ සිය රාජකාරි වැඩ හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ.

3.3 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට එකඟ විය යුතුය.

04. *පොදු කොන්දේසි :*

4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතුය.

4.2 අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු 45ට නොවැඩි විය යුතුය.

4.3 විශිෂ්ට චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතුය.

4.4 දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවෙක් නොවිය යුතුය.

4.5 අයදුම්පත් භාරගන්නා අවසන් දිනට බිංගිරිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ යටත් පිරිසෙයින් වසර තුනකට (03) නොඅඩු කාලයක් ස්ථිර පදිංචිව ඇති අයෙකු විය යුතුය. (පදිංචිය පිළිබඳව වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.)

05. *ඉල්ලුම් කළ යුතු ආකාරය :*

5.1 මෙම නිවේදනයේ ආදර්ශ අයදුම්පත පරිදි A4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්තම භාවිතාකොට සකස් කරන ලද අයදුම්පත්‍රය 2019.06.21 වැනි දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ "ලේකම්, ප්‍රාදේශීය සභාව, බිංගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

5.2 ඉල්ලුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

5.3 දැනටමත් රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන්, තම ඉල්ලුම්පත්‍රය තමන්ගේ ආයතන ප්‍රධානියා මගින් එවිය යුතුය.

5.4 අයදුම්පත A4 ප්‍රමාණයේ කඩදාසි වල ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර, සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික ඉදිරිපත් කළ යුතුය.

(අ) උප්පැන්න සහතිකය

(ආ) අධ්‍යාපන සහතික

(ඇ) පදිංචිය සනාථ කිරීම සඳහා මෑතකදී ලබා ගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය.)

(ඈ) මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක් (එක් සහතිකයක් ග්‍රාම නිලධාරිගෙන් ලබාගත් එකක් විය යුතුය.);

(ඉ) වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික;

(ඊ) සේවා සහතික (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතුවූවන්ට);

(උ) අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ පිටපතක්.

06. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන කාලය අතරතුර කාල සීමාවේ දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීමේ, මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ බලය හා මේ සම්බන්ධයෙන් වන වෙනත් ඕනෑම කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණ ගැනීමේ බලය ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා සතුය.

ඒ. ඒ. ජයසිරි,
ලේකම්,
බිංගිරිය ප්‍රාදේශීය සභාව.

2019 මැයි මස 15 වැනි දින,
බිංගිරිය ප්‍රාදේශීය සභාවේ දී ය.

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

**බිංගිරිය ප්‍රාදේශීය සභාව**

**..............................................තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. මුලකුරු සමග නම :——————————————.
   මුලකුරු වලින් හැඳින්වෙන නම :——————————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————————.
3. ස්ථිර පදිංචි ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය :——————————————.
4. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————.
5. ස්ථිර ලිපිනය :——————————————.
6. ස්ත්‍රී/පුරුෂ භාවය :——————————————.
7. උපන් දිනය අවුරුද්ද :—————— මාසය :—————— දිනය:——————
   2019.06.21 වැනි දිනට වයස : අවුරුදු:—————— මාස :—————— දින:——————
8. ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් වන්නේ උපතින්ද?/ලියාපදිංචි වීමෙන්ද? :——————————————.
9. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර) ඃ
   i. විභාගයේ නම:——————
   ii. විභාග අංකය:——————
   iii. විභාග වර්ෂය හා මාසය:——————

iv. සමත් වූ විෂයයන් :

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

10. ජාතික හැඳුනුම්පත් අංකය :――――――――

11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? :――――――――

12. වෘත්තීය සුදුසුකම්

1. ……………………………………………………………………………………………………
2. ……………………………………………………………………………………………………
3. ……………………………………………………………………………………………………
4. ……………………………………………………………………………………………………
5. ……………………………………………………………………………………………………

13. මෙහි සඳහන් කරන ලද තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි, සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බවද පත්වීම් ලැබීමෙන් පසු සේවයෙන් පහ කිරීමට යටත්වන බවද මම දනිමි.

――――――――,
අයදුම්කරුගේ අත්සන.

දිනය :――――――――.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු වූ අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ……………………………………………………මහතා/මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ……………………………වශයෙන් සේවය කරයි. මෙම තනතුරු සඳහා තෝරාගත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය කුමන ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම හැර) භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කරමි./නොකරමි.

…………………………,
දෙපාර්තමේන්තු ප්‍රධානි/ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :――――――――
තනතුර :――――――――
දිනය :――――――――